## ඔබට කළ හැකි දේ

1. **සංඥා ගැන ඉගෙන ගන්න**. භාෂාවන් 17කින් ප්‍රධාන සලකුණු ලැයිස්තුගත කොට ඇති, පහසු ඔබේ පසුම්බියේ ප්‍රමාණයේ අපගේ දර්ශක කාඩ්පත් ඇණවුම් කරන්න. වංචාවට ගොදුරු වූවන් සමඟ සම්බන්ධතා තිබිය හැකි ඔබේ ප්‍රදේශයේ පුද්ගලයින් අතර මෙම කාඩ්පත් බෙදා දිය හැකිය. *www.dhs.gov/bluecampaign*යන වෙබ් අඩවියෙන් ඔබට වැඩි දුර විස්තර ඉගෙන ගත හැකිය.

2. **මිනිස් ජාවාරම පිළිබඳ හෝඩුවාවන් වාර්තා කරන්න.**

   **සැකසහිත මිනිස් ජාවාරම පිළිබඳ ක්‍රියාකාරකම් වාර්තා කිරීමට හෝ ෆෙඩරල් නීති බලාත්මක කිරීමේ ආයතනයෙන් උපකාර ලබා ගැනීමට 1-866-347-2423 අමතන්න, නැත්නම්, www.ice.gov/tipsඅන්තර්ජාල වෙබ් අඩවිය තුළින් හෝඩුවාවක් ඉදිරිපත් කරන්න.**

   ලොව වටා සිටින පුද්ගලයින්ට, සැක සහිත අපරාධ සම්බන්ධ ක්‍රියාවන් පැය 24 පුරාම, සතියකට දින 7දීම, වසරේ සෑම දිනකම හෝම්ලැන්ඩ් සිකියුරිටි ඉන්වෙස්ටිගේෂන්ස් (HSI) හෝඩුවාවන් ලබා දිය හැකි දුරකථන මාර්ගය ඔස්සේ වාර්තා කළ හැකිය. හෝඩුවාවන් ලබා දිය හැකි මෙම දුරකථන මාර්ගය වෙත 802-872-6199 ඇමතීමෙන් ජාත්‍යන්තර වශයෙන් ද ප්‍රවේශ විය හැකිය. HSI විසින් බලාත්මක කරනු ලබන නීති 400කට වැඩි ප්‍රමාණයක් හා සම්බන්ධ මහජන සහ නීති බලාත්මක කිරීමේ ඒජන්සි යන දෙකෙන්ම සහ මිනිස් ජාවාරම හා සම්බන්ධ ඒවා ද ඇතුළුව, මනා පුහුණුවක් ලබා සිටින විශේෂඥයින් වාර්තා භාර ගනු ඇත.

   **පහත සඳහන් දේ වෙනුවෙන්, නැෂනල් හියුමන් ට්‍රැෆිකිං රිසෝර්ස් සෙන්ටර් හෙවත් ජාතික මිනිස් ජාවාරම පිළිබඳ සම්පත් මධ්‍යස්ථානය (NHTRC) 1-888-373-7888 දුරකථනය ඔස්සේ අමතන්න:**

   - ඔබේ ප්‍රදේශයේ සේවා සපයන්නකු සමඟ සම්බන්ධ වී සහාය ලබා ගැනීමට;
   - සිදුවිය හැකි මිනිස් ජාවාරම පිළිබඳ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ලබා දීම; හෝ
   - පුහුණුව, තාක්ෂණික සහාය, හෝ සම්පත් සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් තව දුරටත් ඉගෙන ගැනීම.

   NHTRC යනු පැය 24 පුරාවටම රටෙහි ඕනෑම ප්‍රදේශයකින් ලැබෙන දුරකථන ඇමතුමකට පිළිතුරු ලබා දිය හැකි, රාජ්‍ය නොවන ආයතනයක් විසින් මෙහෙයවනු ලබන ගාස්තුවක් අය නොකෙරෙන ජාතික, ක්ෂණික දුරකථන ඇමතුම් මාර්ගයකි.

3. **ඔබත් ඔබේ ප්‍රජාවත් අධ්‍යාපනයක් ලබා ගන්න**. ඔබ දැනුවත්ව සිටිය යුතු මිනිස් ජාවාරම සහ වෙනත් දර්ශක සම්බන්ධයෙන් වැඩි දුර ඉගෙනීම සඳහා, අපගේ නොමිලේ සපයන අන්තර්ක්‍රියා සහිත අන්තර්ජාල පුහුණුව ලබා ගෙන, ඔබ දන්නා වෙනත් අයටත් එම පුහුණුව ලබා ගන්නා මෙන් පවසන්න. *www.dhs.gov/bluecampaign*වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

4. **විස්තර පතුරුවා හරින්න!**අප විසින් ලබා දෙන විවිධ වැඩසටහන් සහ පවුල් වලට සහාට සැපයිය හැකි ආකාරය සහ ලැදියාවක් දක්වන ඕනෑම අයෙකුටත්, Blue Campaign සම්බන්ධයෙන් ඔබේ සගයින්ටත් කියන්න. විස්තර *www.dhs.gov/bluecampaign*වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය

5. **Blue Campaign වෙබ් අඩවියට පිවිසෙන්න**. මිනිස් ජාවාරම නතර කළ හැකි සටනට එක් විය හැකි අන්දම පිළිබඳ තොරතුරු දැන ගැනීමටත් වැඩි පුහුණුවක් ලබා ගැනීමටත්, බාහිරව ළඟා වීම සම්බන්ධ ද්‍රව්‍ය, වංචාවට ගොදුරු වූවන්ට ආධාර කළ හැකි ආකාර ගැන දැන ගැනීම සඳහා පහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසෙන්න: *www.dhs.gov/bluecampaign*ෆේස්බුක් හි අපව "Like" කරන්න: *www.facebook.com/bluecampaign* හෝ *BlueCampaign@hq.dhs.gov*හි දී අප සමඟ එක්වන්න.

ගොදුරු වූවන් හඳුනාගැනීම

රාජ්‍ය නොවන ආයතනය

ඇඳහිලි මත පදනම් කණ්ඩායම



# ඔබට කළ හැක්කේ කුමක්ද?

වංචාවට ගොදුරු වූවන් හඳුනා ගැනීම සහ මිනිස් ජාවාරම පිළිබඳ සැක සහිත අවස්ථාවන් වාර්තා කිරීමයි

BLUE CAMPAIGN
One Voice. One Mission. End Human Trafficking.™

# *ඔබට කළ හැක්කේ කුමක්ද?*

*වංචාවට ගොදුරු වූවන් හඳුනා ගැනීම සහ මිනිස් ජාවාරම පිළිබඳ සැක සහිත අවස්ථාවන් වාර්තා කිරීම*

## ගොදුරු වූ තැනැත්තා ඔබට පෙනෙන ස්ථානයක සිටිය හැකිය

ගුරුවර ගුරුවරියන්, හෙද හෙදියන්, සමාජ සේවකයින්, ආගමිකනායකයින්, සහ රාජ්‍ය නොවන සංවිධාන ( NGOs) ප්‍රජා සාමාජිකයින් වන අතර, වංචාවට ගොදුරු වූවන් ඔවුනට මුණ ගැසිය හැකිය. මොවුන්ට, ඔවුන් හඳුනා ගෙන වංචාවට ලක් වූවනට සහාය ලබා දිය හැකිය. මිනිස් ජාවාරම පිළිබඳ සංඥා සහ දර්ශක ගැන ඔබ ඉගෙන ගත යුතුය. කූටනයට ගොදුරු වූවන් හඳුනා ගෙන මිනිස් ජාවාරම සිදු කරන්නන් නීතිය ඉදිරියට ගෙන ඒමමුල් පියවර මෙය වන අතර, එමගින් ඔබේ ප්‍රජාව ආරක්ෂිතව තබා ගැනීමට උපකාර කළ හැකිය.

වංචාවට ගොදුරු වූවන් අපගේ ප්‍රජාව තුළ සිටිති.

ඔවුන්, එක්සත් ජනපද පුරවැසියන් මෙන්ම, ඕනෑම වයසක, ජාතියක, ස්ත්‍රී හෝ පුරුෂභාවයක හෝ ජාතියක විය හැකිය.

ඔවුනට, නීතිමය ආගමනික තත්ත්වයක් තිබීමට හෝ නොතිබීමට පුළුවන. වංචාවට ගොදුරු වූවන්, නීත්‍යානුකූල සහ නීත්‍යානුකූල නොවන කම්කරු අංශ වල සිටිය හැකිය; ඇතැමුන් ව පොළඹවා ගනු ලබන්නේ හොඳ වැටුප් ලබා දෙන රැකියා වැනි ව්‍යාජ පොරොන්දු ලබා දීමෙන් හෝ සමහර විට ආදරය සම්බන්ධ කර ගෙනයි. ඔවුන්, පූජනීය ස්ථාන, පාසැල්, නිවාස, හෝටල්, ආපන ශාලා, ඉදි කිරීම් වැඩපල, ගොවිපල, බස් සහ දුම්රිය ස්ථාන, ගුවන් තොටුපොල, අසල්වැසි උද්‍යාන, ලොරි නතර කරන ස්ථාන සහ මහා මාර්ග වල විවේක ගන්නා ස්ථානවල සිටිය හැකිය; නැත්නම් සම්භාහන මධ්‍යස්ථාන, බාර් හෝ ස්ට්‍රිප් ක්ලබ් වල ද සිටිය හැකිය. බොහෝ අවස්ථා වලදී ඔවුන්ව බලෙන් හෝ බලාත්කාරකම් පාමින්, ගෘහ සේවය, ගොවිපලක හෝ කර්මාන්ත ශාලාවක කම්කරු සේවය හෝ වෙනත් ආකාරයේ බලෙන් ගනු ලබන ශ්‍රමය සඳහා හෝ වාණිජ ලිංගික සේවා (ගණිකා වෘත්තිය) සඳහා යොදා ගැනේ. ෆෙඩරල් නීතිය යටතේ, වාණිජ ලිංගික සේවය සඳහා යොදා ගන්නා සෑම බාලවයස්කාර පුද්ගලයකුම මිනිස් ජාවාරමට ගොදුරු වූ තැනැත්තෙකි.

## මිනිස් ජාවාරමේ යෙදෙන පුද්ගලයින් ක්‍රියාකරන ආකාරය

සමාජ ආරක්ෂාව නොමැති හෝ සුළු වශයෙන් පමණක් ඇති පුද්ගලයින්, මනුෂ්‍ය කූටනයේ යෙදෙන අය විසින් ගොදුරු බවට පත් කර ගනී. ආර්ථික අපහසුතා, නිවස තුළ ප්‍රචණ්ඩත්වය, ස්වාභාවික ව්‍යසන, හෝ දේශපාලනික අස්ථාවරත්වය ඇතුළුව, විවිධ හේතූන් නිසා වඩාත් අවදානමකට භාජනය විය හැකි පුද්ගලයින් මොවුන් සොයති. මිනිස් ජාවාරමේ යෙදෙන පුද්ගලයින්, ජනතාව සිය උගුල් වලට හසු කර ගැනීමට හෝ වහල්කමට යොමු කරවීම සඳහා, ප්‍රචණ්ඩත්වය හෝ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ තර්ජන පමණක් නොව, මානසික බලාත්කාකම් වැනි විවිධාකාර උපාය ක්‍රම භාවිතා කරති. මෙයින් සිතෙහි ඇති වන කම්පනය ඉතා දැඩි විය හැකි අතර, ඔවුන්, කූටනයට ගොදුරු වූවන් ලෙස තමන් හඳුනා නොගන්නා අතර, ඉතාමත් ප්‍රසිද්ධ පසුබිම් වලදී පවා හෝ සහාය නොපතයි.

### මිනිස් ජාවාරමේ යෙදෙන අය ක්‍රියාකරනු ලබන්නේ:

- ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීම හෝ පුද්ගලයා හෝ පුද්ගලයාගේ පවුලේ සාමාජිකයින් හිංසාවට ලක් කිරීමෙන් හෝ තර්ජනය කිරීමෙන්;
- ආහාර, ජලය හෝ නින්ද වැනි මූලික අවශ්‍යතා පුද්ගලයාට ලබා නොදීමෙන් හෝ ඔහුට හෝ ඇයට හානියක් කිරීමෙන්;
- ආදරය හෝ මිත්‍රත්තවය සම්බන්ධයෙන් ව්‍යාජ පොරොන්දු ලබා දීමෙන්;
- ආගමික වතාවත් වලට සහභාගී වීමෙන් පුද්ගලයා වැළැක්වීමෙන්;
- මිතුරන් හෝ පවුලේ අය සමඟ සබඳතා සීමා කිරීමෙන්;
- එහා මෙහා යාමේ නිදහස සීමා කිරීමෙන්;
- පුද්ගලයාගේ අනන්‍යතාවය ඔප්පු කරන ලියකියවිලි පාලනය කිරීමෙන්;
- රටින් නෙරපීම හෝ නීති මාර්ගයෙන් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් තර්ජනය කිරීමෙන්; සහ/හෝ
- පවතින බවට කියනු ලබන ණය ගෙවා දැමීමට පුද්ගලයාගේ වැටුප ඉහළ නැංවීමෙන්.

## මිනිස් ජාවාරම පිළිබඳ සංඥා

වංචාවට ගොදුරු වූවන් හඳුනා ගැනීමෙන් සහ හෝඩුවාවන් වාර්තා කිරීමෙන්, නීතිය බලාත්මක කරන පුද්ගලයින්ට එවැනි ගොදුරු වූවන් මුදවා ගැනීමට උපකාර කිරීමෙන් සහ ඇතැම් විට ජීවිතයක් බේරා ගැනීමට පවා සහාය ලබා දීමෙන් ඔබ ඔබේ යුතුකම් කොටස ඉටු කරයි. ඔබට, වංචාවට ගොදුරු වූ පුද්ගලයින්, වෛද්‍ය සහ මානසික සෞඛ්‍ය සේවාවන්, නවාතැන්, රැකියා පුහුණුව, සහ නීතිමය ආධාර වැනි ඔවුන්ගේ නිදහස සහ ගරුත්වය නැවත ලබා දෙන ආකාරයේ සේවාවන් වෙත යොමු කළ හැකිය. ඔබේ මෙන්ම වංචාවට ගොදුරු වූ තැනැත්තාගේ ආරක්ෂාව ප්‍රමුඛත්වය ගනී. කිසිදු අවස්ථාවක මිනිස් ජාවමේ යෙදෙන බවට සැක කරන පුද්ගලයෙකු හා ඍජුව මුහුණට මුහුණ ලා කටයුතු කිරීමට උත්සාහ නොගන්න සහ ඔබේ සැකයන් වංචාවට ගොදුරු වූ පුද්ගලයකු හට දැනෙන්නට ඉඩ නොහරින්න. දර්ශක දැකීමට තිබීම හෝ නොතිබීම, අවශ්‍යයෙන්ම මිනිස් ජාවාරම පිළිබඳ සාක්ෂි නොපෙන්වයි. සැක සහිත මිනිස් ජාවාරම පිළිබඳ අවස්ථා ගැන පරීක්ෂා කිරීම නීතිය බලාත්මක කරනු ලබන පුද්ගලයින් හට භාර වේ.

- පුද්ගලයා සිය පවුලේ අය, මිතුරන්, ප්‍රජා සංවිධාන හෝ පූජනීය ස්ථාන වලින් ඈත් වී සිටින බවක් පෙනෙන්නට තිබේද?
- දරුවා පාසැල් යෑම නතර කොට තිබේද?
- පුද්ගලයාගේ හැසිරීමේ හදිසි හෝ අමුතු වෙනසක් දක්නට තිබේද?
- බාල වයස්කරු වාණිජ ලිංගික ක්‍රියාකාරකම් වල යෙදී සිටින්නේද?
- පුද්ගලයා අන්දමන්ද වී සිටින බවක්, ව්‍යාකූලභාවයක් හෝ මානසික හෝ ශාරීරික අපහරණයට ලක් වී ඇති බවට සලකුණු දක්නට තිබේද?
- විවිධ අදියරවල සුව වෙමින් පවතින තුවාල පුද්ගලයා සතුව තිබේද?
- පුද්ගලයා, බියකරුව, බයාදු ලෙස හෝ යටහත් පහත්ව සිටින ස්වරූපයක් පෙන්නුම් කරයිද?
- ආහාර, ජලය, නින්ද හෝ සෞඛ්‍ය ප්‍රතිකාර පුද්ගලයාට නොලැබී ඇති බව දක්නට තිබේද?
- සෑම විටම ඔහු හෝ ඇය ගෙන් අවසර ලබා ගන්නා සුළු පුද්ගලයකු සමඟ මේ තැනැත්තා සිටිනු දක්නට තිබේද? එසේ නැත්නම්, අවස්ථාව පාලනය කරනු ලබන තැනැත්තෙකු සමඟ, නිදසුනක් වශයෙන්, ඔවුන් යන ස්ථානය හෝ ඔවුන් කතාබස් කරන්නේ කවුරුන් සමඟ ද යන්න, පුද්ගලයා සිටින්නේද?
- කිව යුත්තේ කුමක් දැයි සම්බන්ධයෙන් පුද්ගලයාට කළින් පුහුණුවක් ලබා දී ඇති බව දක්නට ලැබේද?
- නුසුදුසු තත්ත්වයන් යටතේ පුද්ගලයා වාසය කරන්නේද?
- පුද්ගලයාට, පෞද්ගලික බඩු බාහිරාදිය නොමැති බවක් සහ වාසය කිරීමට ස්ථාවර ස්ථානයක් නොමැති බව පෙනී යන්නේද?

BLUE CAMPAIGN
One Voice. One Mission. End Human Trafficking.™